PR/2019/5/S

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan

**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ශ්‍රීමත් ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
දුරකථනය (+94-11-2693831~3, ෆැක්ස් (+94-11-2698629)
ඊමේල්: cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

2019 ජනවාරි මස 25 වන දින

**ජපානයෙන් දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා බ්‍රේල් පහසුකම්**

ජපන් රජය මගින් එහි බිම් මට්ටමේ මානව ආරක්ෂණය සඳහා වන ආධාර ව්‍යාපෘතිය (GGP) ව්‍යාපෘතිය යටතේ , “දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ තොරතුරු සඳහා ප්‍රවේශය තහවුරු කිරීම” වන ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් 98,191 (දළ වශයෙන් රුපියල් මිලියන 16 ක) ප්‍රදානයක් ලබාදීමට තීරණය කර ඇති අතර ඒ සඳහා වන ගිවිසුමට අත්සන් තැබීම 2019 ජනවාරි 24 දින, ජපන් තනාතිපති අකිරා සුගියාමා මහතා සහ දෘශ්‍යාබාධිත උපාධිදාරීන්ගේ ශ්‍රී ලංකා කවුන්සලයේ ගරු සභාපති සුගත් වසන්ත ද සිල්වා මහතා අතර ජපන් තානපති නිල නිවසේ දී සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතිය මගින් දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට ඉලෙක්ට්‍රොනික තොරතුරු ලබාගැනීමට ඇති අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා ජපානයේ නිෂ්පාදිත බ්‍රේල් මුද්‍රණ යන්ත්‍ර සහ බ්‍රේල් ප්‍රදර්ශන යන්ත්‍ර ලබා දීමට කටයුතු යොද ඇත" 2012 වසරේ ජාතික නිවාස සහ ජන සංගණන තොරතුරු වලට අනුව මිලියනයක් පමණ දෘශ්‍යාබාධිත පුද්ගලයන් සංඛ්‍යාවක් ලංකාවේ ජීවත් වන බවට අනාවරණය වී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමග දෘශ්‍යාබාධිත උපාධිධාරීන්ගේ ශ්‍රී ලංකා කවුන්සිලය මගින් මාසිකව බ්‍රේල් සඟරාවක් ප්‍රකාශයට පත්කිරීමටත් ඒවා ලංකාව පුරා පුස්තකාලවලට බෙදහැරීමටත් කටයුතු කෙරේ" එමෙන්ම එහි මොරටුව ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිතකර ඇති බ්‍රේල් ප්‍රදර්ශන යන්ත්‍රය මගින් මහජනයාට පරිගණක යන්ත්‍ර වල ඇති තොරතුරු කියවීමටද හැකියාව ලැබේ.

මෙම ප්‍රදානය පිළිබඳව අදහස් දක්වමින් ද සිල්වා මහතා සඳහන් කළේ, බොහෝ දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට තොරතුරු දැනගැනීම සඳහා ප්‍රවේශයක් නොමැති අතර, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ ආබාධිත පුද්ගලයන් සඳහා වන සම්මුතිය 2016 පෙබරවාරි 8 වන දින අනුමත කරන ලද නමුත්, එහි 21 වැනි වගන්තියට අනුකූලව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු සඳහා ප්‍රවේශය ආබාධිත පුද්ගලයන්ට හිමිවී නැති බවයි. මෙම ව්‍යාපෘතිය මගින් බ්‍රේල් මාධ්‍ය ඔස්සේ දෘශ්‍යාබාධිත පුද්ගලයන්ට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට අවස්ථාව සැලසෙන බවයි.

1912 තරම් ඈත කාලයේදී ශ්‍රී ලංකාවට බ්‍රේල් ක්‍රමය හඳුන්වා දී ඇති නමුත් බ්‍රේල් ක්‍රමයට කියවිය හැකි පොත් කිහිපයක් පමණක් දැකිය හැකි අතර නව තොරතුරු දැනගැනීමට පහසුකම් නොමැත. මෙම ප්‍රදානයත් සම්බන්ධව ශ්‍රී ලංකාවේ දෘශ්‍යාබාධිත ප්‍රජාව වෙනුවෙන් මම මාගේ හෘදයාංගම ස්තුතිය ජපන් රජය වෙත පිරිනමන බවද ඔහු පැවසිය.

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න
ජපන් තානාපති කාර්යාලයේ ආර්ථික සහයෝගිතා අංශය
දුරකථන අංක 011-2693831 දිගුව 225
ඊමේල් : cultujpn@co.mofa.go.jp